**<u>සියළුම සේවාලාභීන් හා අදාල නිලධාරීන් වෙත කරනු ලබන කාරුණික දැනුම්දීමයි.</u>**

මෙතෙක් ඔබ වෙත ලබා දුන් සේවාවන්ට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවිය නවීකරණය කරමින් දැන් ඔබට පහත සඳහන් නව සේවාවන් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.

1. ඔබේ ඉල්ලීම් ලිපියේ/අභියාචනයේ/අයදුම්පත්‍රයේ ඔබේ ජාතික හැඳුනම්පත් අංකය සහ පෞද්ගලික ජංගම දුරකථන අංකය  සඳහන් කර එවන්නේ නම්, එය අප වෙත ලද වහාම ඔබේ ඉල්ලීමට අදාල "යොමු අංකය" කෙටි පණිවිඩයක් මගින් ඔබේ ජංගම දුරකථනයට එවනු ලැබේ. එම "යොමු අංකය" භාවිතා කර ඔබට පහත සඳහන් සේවාවන් ලබා ගත හැකිය.

(අ). PSC <හිස්තැනක්>යොමු අංකය 0704364462 අංකයට SMS මගින් යොමු කිරීමෙන් ඔබේ ඉල්ලීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයේ නවතම තත්වය ඕනෑම මොහොතකදී ඔබට SMS පණිවිඩයක් මගින් ලබාගත හැකිවේ.

(ආ). නවීකරණය කරන ලද වෙබ් අඩවියට පිවස එහි "තත්ත්ව ග්‍රහණය" (Status Tracking) කවුළුවට ඔබේ යොමු අංකය ඇතුළත් කිරීමෙන් ඔබේ ඉල්ලීම සම්බන්ධයෙන් ආරම්භයේ සිට මේ මොහොත දක්වා ගෙන ඇති සියළුම ක්‍රියාමාර්ග ඔබට එකවර නිරීක්ෂණය කළ හැක.

ඔබේ ඉල්ලීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී කිසියම් ප්‍රමාදයක් සිදුවන්නේ නම් එය කුමන ආයතනයකින් සිද්ධ වනේනද්‍යි මෙමගින් ඔබට දැන ගත හැකිවේ. ඒ අනුව ඒ පිළිබඳව විමසා බැලීම මගින් ඔබේ කාර්ය ඉක්මන් කරවීමට ඔබට අවස්ථාව ලැබේ. එය අප වෙත ලබා දෙන සහායකි. එසේම ඔබ මෙම කාර්යාලය අමතන්නේ නම් සෑම විටම 0112-136603 අංකය ඔස්සේ අතිරේක ලේකම් (මෙහෙයුම්) පමණක් ඇමතීමෙන් අපට සහයවන්න. අනෙකුත් නිලධාරීන් ඇමතීම ඔවුන්ගේ රාජකාරියට කරන බාධාවක් විය හැක. එසේම ඔබේ යොමු අංකය අන්සතු වීම ඔබට හානිකර විය හැකි බැවින් එය සුරක්ෂිත කරගන්න.

මෙම සේවාව ලබාගත හැක්කේ ඒක පුද්ගල ඉල්ලීම් සඳහා පමණක් බව කාරුණිකව සලකන්න. එසේ වුවද, එක් අයෙකුට වැඩි දෙනෙකු සම්බන්ධයෙන් වන පොදු ඉල්ලීම් පිළිබඳව අදාල ආයතන ප්‍රධානියාට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ අමාත්‍යාංශ ලේකම්වරයාට, තම ජංගම දුරකථන

අංකය අපවෙත ලබාදීමෙන් හෝ අප වෙතින් යොමු අංකය ලබා ගැනීමෙන් අවශ්‍ය නම් මෙම සේවාව ලබාගත හැකිය.

2. මෙම කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණ දිනපතා අදාල අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දන්වා යවනු ලබන අතර එසේ යැවීමෙන් පසු එසේ යැවූ බව වැඩකරන දින 2ක් ඇතුළත වෙබ් අඩවියේ පලකරනු ලැබේ. ඒ අනුව අපගේ වෙබ් අඩවියට පිවිස "නවතම තීරණ" නිරීක්ෂණය කිරීමෙන් ඔබේ කාරණයට අදාල තීරණය ඔබේ අමාත්‍යාංශ ලේකම් වෙත යවා ඇති බව සනාථ කරගත හැක.
3. මෙම වෙබ්අඩවිය මගින් දැනටමත් ඔබට ලබාගත හැකි විවිධ තොරතුරු, ආකෘතිපත්‍ර, චක්‍රලේඛ ආදියට අමතරව සංස්කරණය කරන ලද රීති මාලාව, පුරවැසි ප්‍රඥප්තිය, සියලුම සේවා ව්‍යවස්ථා, බඳවාගැනීම් පරිපාටි, ස්ථානමාරු පරිපාටි, ආදිය මෙන්ම ඔබ වෙනුවෙන් විවිධ ආයතන වෙතින් අප ඉල්ලා ඇති වාර්තා, නිර්දේශ, නිරීක්ෂන පිළිබඳ තොරතුරු ලබාදීම ප්‍රමාද වී ඇත්නම් ඒ පිළිබඳ විස්තරද ඔබේ පහසු පරිශීලනය හා දැනගැනීම සඳහා වෙබ් අඩවිය මගින් ප්‍රසිද්ධ කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

දෛනිකව ඔබේ ඉල්ලීම් 200-300 පමණ ලැබෙන මෙම කාර්යාලය ඉහත සියලු උපක්‍රම මගින් උත්සාහ කරන්නේ ඔබගේ හා අපගේ කාලය, ශ්‍රමය හා ධනය ඉතිරි කරමින් ඔබට ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂම සේවාවක් ලබා දීමටයි.

මෙම උත්සාහයේදී විවිධ තාක්ෂණික හේතූන් නිසා මුල් අවස්ථාවේදී යම් ප්‍රමාදදෝෂ ඇතිවිය හැකිය. එබැවින් එවැනි තත්ත්වයන් හමුවේ ඉවසීමෙන් හා සද්භාවයෙන් යුතුව ඔබ විසින් ලබාදෙනු ලබන සාධනීය යෝජනා/චෝදනා භාර ගැනීමට අප සූදානමින් සිටින්නෙමු. ඒ සඳහා අතිරේක ලේකම් ( මෙහෙයුම් ) අමතන්න. ඔබට කාර්යක්ෂම සේවාවන් ලබා දීමට අපට සහාය වන්න.

එම්.ඒ.බී.දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2020.08.24